# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන)

**(129 වන අධිකාරය වූ) සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා විසින් 2018 මැයි මස 11 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2018 අප්‍රේල් මස 18 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[247 වන පනත් කෙටුම්පත]**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 12.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් (129 වන අධිකාරය වූ) සාප්පු හා කාර්යාලයීය සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 18ආ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එහි නීතිය බලපෑමේ ප්‍රකාශය වනුයේ ස්ත්‍රී සේවකයකුට දරු ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි වුවහොත් එම දරු ප්‍රසූතියේ දින සිට දින හැත්තෑවක කාලසීමාවක් සඳහා හා එම දරු ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි නොවුවහොත් එම දරු ප්‍රසූතියේ දින සිට ආරම්භවන දින විසි අටක කාලසීමාවක් සඳහා වන නිවාඩුවකට හිමිකම් ලැබීමයි.

## කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන)

එල්. ඩී—ඕ. 29/2009.

**(129 වන අධිකාරය වූ) සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2018 අංක     දරන කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (129 වන අධිකාරය වූ) සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතෙහි 18ආ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 129 වන අධිකාරයේ 18ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2) මේ කොටස අදාළ වන ස්ත්‍රී සේවකයකුට දරු ප්‍රසූතියක් වුවහොත් ඇයට—

(අ) එම දරු ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි වුවහොත් එම දරු ප්‍රසූතියේ දින සිට ආරම්භ වන දින හැත්තෑවක කාලසීමාවක් සඳහා; සහ

(ආ) එම දරු ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි නොවුවහොත්, එම දරු ප්‍රසූතියේ දින සිට ආරම්භවන දින විසිඅටක කාලසීමාවක් සඳහා,

නිවාඩු ලබා ගැනීමට එම තැනැත්තියට හිමිකම ඇති අතර, අදාළ සේවායෝජකයා විසින් එම නිවාඩු ලබා දිය යුතු ය.'';

(2) එම වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.